# ලංකාවේ දෙමල ජනයා සතු ජාතික ස්වයං-නිර්ණ අයිතිය

අප පසුගිය ලිපියෙන් සාකච්ඡා කළේ ලංකාවේ පවතින ජාතික ගැටළුවට පදනම් වී තිබෙන දේශපාලන සහ ආර්ථික පසුබිම සම්බන්ධයෙනු යි. ලංකාවේ දෙමල ජනතාව ඉල්ලා සිටින ස්වයං නිර්ණ අයිතිය ගැන සාකච්ඡා කරන මෙම ලිපියෙන් 'ජාතික ස්වයං නිර්ණය සඳහා ජනතාවන්ට ඇති අයිතිය' පිළිබඳ ලිපි පෙල අවසන් කරන්නට බලාපොරොත්තු වූයෙමි. එහෙත් මෙම මාතෘකාව ගැන කරන සාකච්ඡාව අවසන් කරන්නට තවත් එක් ලිපියක් අවශ්‍ය වන බව පෙනී යයි.

යටත් විජිත වාදීන් වෙත ඇප කැප වී ඔවුන්ගේ වරප්‍රසාද සහ එල ප්‍රයෝජන ආරක්ෂා කර දුන්, එසේ කිරීම සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවයන් ට සරිලන ආකාරයෙන් තමන්ගේ භාෂාව, ආගම, ඇඳුම් පැලඳුම් සහ සිරිත් විරිත් යනාදිය වෙනස් කර ගෙන, යටත් විජිත වාදීන් ගේ පරිපාලනයට මුක්කු ගැසූ අය අතර සිංහලයන් ද, දමිලයන් ද, මුසුල්මානුවන් ද වූහ. යටත් විජිත වාදීන් විසින් මෙම යටත් විජිත ගැති 'දේශීය' පරිපාලකයන් උපයෝගී කොට ගෙන සිංහල බෞද්ධ මෙන්ම දෙමල හින්දු සාමාන්‍ය ජනතාව ඔවුන්ගේ ග්‍රහණයට නතු කොට තබා ගන්නා ලදී.

ලාංකීය සමාජය මත ධනේශ්වර ක්‍රමය උත්තරාරෝපණය කරන විට ප්‍රාග් ධන සංචිතකරණයේ ප්‍රධාන මෙවලම බවට පත් වූයේ ඉඩම් අයිතියයි. බ්‍රිතාන්‍ය යටත් විජිතවාදීන් විසින් 'මුඩුබිම් පණත' යටතේ ඉඩම්වලින් ප්‍රධාන කොටසක් පළමුවැනි වටයේදී ම අත්පත් කර ගන්නා ලදි. දෙවැනි වටයේ දී ඊළඟ ප්‍රධාන ඉඩම් කොටස බ්‍රිතාන්‍ය යටත් විජිතවාදීන් විසින් රබර් හා පොල් වතු වගාව සඳහා යටත් විජිත ගැති සිංහල කොටස් වෙත ලබා දෙන ලද අතර මෙම කොටස් සෞභාග්‍යමත් බවට පත් වූයේත් ධනේශ්වර පංතියක් ලෙස දේශපාලන කරලිය ට ආවේත් ඒ අයුරිනි. දෙවැනි වටයේ දී කරන ලද මෙම ඉඩම් අත්පත් කර ගැනීම තුලින් ලංකාවේ පළමු වරට ඉඩම් අහිමි ගොවි ජන කොටසක් බිහි වූයේය. තේ හා කෝපි වගාව සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩම් බොහෝ විට ජනාවාස වූ ඒවා නොවීය. සංසන්දනාත්මක ලෙස ගත් විට යටත් විජිත ගැති දෙමල කොටස් වෙත ලබා දෙන ලද්දේ ඉඩම් සුළු ප්‍රමාණයකි. 1948 න් පසු 'ජාතික ගැටළුව'ට අදාල ප්‍රශ්ණ දිග හැරෙන විට, ඉඩම් අහිමි ගොවි ජන කොටස්වලින් පැවතෙන පරම්පරාවන් පිළිබඳ ප්‍රශ්ණය ද කරලියට පැමිණියේය.

ලාංකීය සමාජය තුල ධනේශ්වර ක්‍රමයේ ලක්ෂණ වර්ධනය වූ ප්‍රමාණයට අනුපාතික ලෙස යටත් විජිත විරෝධී වූත් ජාතික වාදී වූත් බලවේග ද වර්ධනය වන්නට පටන් ගත්තේය. මෙම කාලයේ පැවතුනු තත්වය ගැන මහාචාර්ය ජේ ඊ ජයසූරිය මහතා පවසා ඇත්තේ මෙසේය. 'සිංහලයන් සිංහල නැතිව කටයුතු කිරීමට සූදනම් ව සිටි යුගයක සිංහල හා දෙමළ සඳහා වූ සටන ගෙන ගියේ ද්‍රවිඩ නායකයන් විසිනි. මේ සඳහා ඒ පී ෆ්‍රේසර් වැනි ඉංග්‍රීසි ජාතිකයන්ගේ සහාය ද ලැබුණි.'

දෙමල නායකයන් දේශයට නිදහස ලබා ගන්නට සම්බන්ධ වූ ආකාරය ප්‍රකාශයට පත් කෙරුන හොඳම උදහරණය වූයේ පොන්නම්බලම් රාමනාදන් මහතා ය. ලංකාවේ ඡන්දයෙන් පත් වූ පළමුවන මන්ත්‍රී වරයා වූයේ ඔහු ය. සිංහල නායකයන්ට පෙරාතුව ස්වභාෂාවෙන් අධ්‍යාපනය ලබා දීම ගැන උද්ඝෝෂණය කල දෙමල නායකයන් අතර කැපී පෙනුනේ පොන්නම්බලම් අරුණාචලම් මහතා ය. ප්‍රතිසංස්කරණවාදී ලෙස ඉදිරියට ඇදෙමින් තිබුනු ජාතික නිදහස සඳහා වූ ව්‍යාපාරය 1924 දී පමණ අධිරාජ්‍ය විරෝධී සහ විප්ලවකාරී ස්වරූපයකින් පෙරට ගන්නට මුල් වූයේ ස්වරාජ්‍යය (Swaraj) ක් ලබා ගැනීම සඳහා ඉන්දියාවේ ගෙන යන ලද අරගලයේ ආභාෂය ලද යාපනයේ තරුණ සංගමය මිස සිංහල ධනේශ්වර නායකයන් නොවේ.

අධිරාජ්‍යයෙන් ලාංකීය දේශයේ නිදහස ලබා ගැනීම සඳහා 1924 පටන් උත්තුංග ලෙස කටයුතු කළ දෙමල තරුණයන් 1974 පමණ වන විට 'සිංහල අධිරාජ්‍යයෙන් වෙන් වූ දෙමළ ඊලාම් දේශයක' නිදහස ලබා ගැනීම සඳහා ආයුධ සන්නද්ධ ප්‍රචණ්ඩ ව්‍යාපාරයක් කරා යොමු වූයේ ඇයි? මෙම ප්‍රශ්ණයට අවංක ලෙස පිළිතුරු සොයනු වෙනුවට සියළුම මාදිලියේ සිංහල ජාතිකවාදීන් අඳුරේ අතපත ගාමින් සිටින්නේ ඇයි?

ලංකාවේ දෙමල ජනතාවට ඔවුන්ටම පමණක් සීමා වූ ප්‍රශ්ණයක් නොමැති බවත්, ජාතිය සහ භාෂාව අනුව ඔවුන්ට වෙනස්කම් කිරීමක් නොකෙරෙන බවත් දෙමල ජනතාවට ඇත්තේ සිංහල ජනතාවට බලපාන ප්‍රශ්ණවලට සමාන ප්‍රශ්ණ පමණක් බවත් ඇතැම් අය ප්‍රකාශ කර සිටිති. මේ ගැන මා දරන මතය ඉතා කෙටියෙන් හෝ පැහැදිලි කල යුතුව ඇත.

සිංහල සහ දෙමල වැඩ කරන ජනතාවට පොදුවේ බලපාන ප්‍රශ්ණ ගණනාවක් තිබෙන බව සැබෑය. ඔවුහු මෙම ප්‍රශ්ණවලට පසුගිය අඩවස මුළුල්ලේ ම මුහුණ දී සිටියහ. අද ද ඔවුහු එම ප්‍රශ්ණවලට මුහුණ දී සිටිති. එහෙත් සිංහල ජනතාවට බල නොපාන්නා වූ ප්‍රශ්ණ ගණනාවකට ද දෙමළ ජනතාව පසුගිය අඩවස මුළුල්ලේ මුහුණ දී සිටියේය. අද ද ඔවුහු එම ප්‍රශ්ණවලට මුහුණ දී සිටිති. ඔවුන්ටම විශේෂ වී තිබෙන මෙම ප්‍රශ්ණ මොනවාදැයි කෙටියෙන් විමසා බලමු.

1947 සිට මේ දක්වා පවත්වා ගෙන යනු ලබන ඒකීය රාජ්‍ය තත්වය ලංකාවේ පිහිටුවන ලද්දේ බ්‍රිතාන්‍ය යටත් විජිතවාදීන් විසිනි. එසේ ඒකීය රාජ්‍යය සම්පූර්ණ ලෙස ස්ථාපිත කරන්නට ඔවුහු නීතිමය, උපාය මාර්ගික සහ පරිපාලනමය යන වශයෙන් අදියර තුනකින් ක්‍රියා කළහ. නීතිමය අදියර වූයේ 1815 දී උඩරට ගිවිසුම අත්සන් කිරීම මගින් මුළු රටම බ්‍රිතාන්‍ය කිරීටය යටතේ තනි දේශපාලන ඒකකයක් වශයෙන් ගොනු කර ගැනීමයි. උපාය මාර්ගික අදියර වූයේ 1820 සිට 1830 දක්වා මහා මාර්ග පද්ධතියක් ගොඩ නැගීම මගින් රටේ එවකට තිබුනු භූමි කලාප එකම මධ්‍යස්ථානයක් වටා සමීප ලෙස කේන්ද්‍ර ගත කර ගැනීමයි. රටේ ඕනෑම ප්‍රදේශයකට ක්ෂණික ව ප්‍රවේශ වෙන්නට තිබුනු මෙම උපාය මාර්ගික අවශ්‍යතාවය සම්පූර්ණ කර ගන්නා ලද්දේ ප්‍රධාන වශයෙන් 1818 කැරැල්ල (නැගී සිටීම) සමයේදී ය. පරිපාලනමය අදියර වූයේ 1832 දී "කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ" මගින් මුළු රටම එක් පරිපාලනක් යටතට ගෙන ඒම මගින් මුළු රටම මධ්‍යගත කිරීමේ ක්‍රියාදමය සම්පූර්ණ කර ගැනීමයි.

යටත් විජිතවාදීන්ට එරෙහිව වේදිකා දෙදරවන සියළුම ආකාරයේ සිංහල ජාතික වාදීන් කැප වී සිටින්නේ බ්‍රිතාන්‍ය යටත් විජිතවාදීන් විසින්ම අපට උරුම කොට දී තිබෙන මෙම ඒකීය රාජ්‍ය සංකල්පය දිවි හිමියෙන් රැක ගැනීම සඳහා ය. සිංහල නොවන ජන කොටස් වල අයිතිවාසිකම් රැක ගැනීම සෝල්බරි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ දුෂ්කර කටයුත්තක් බවට පත් කොට තිබුනේය. සිංහල නොවන ජන කොටස් වල අයිතිවාසිකම් පිළිබඳව එම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කොට තිබූ සහ ව්‍යවස්ථාවටම පමණක් සීමා කොට තිබූ 29(2) උප වගන්තිය ද 1972 සහ 1978 දී ජනතාව මත පටවන ලද ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවලින් ඉවත් කර දමන ලදී.

1947 දී දෙමළ වතු කම්කරු ජන කොටස් විසින් ඔවුන් නියෝජනය කරන්නට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හත් දෙනෙකු තෝරා පත් කර ගන්නා ලදී. ඒ සඳහා ඔවුන් යොදා ගත්තේ 1931 සිට ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ ඔවුන් විසින් භුක්ති විඳින ලද්දවූ සර්වජන ඡන්ද බලය යි. මෙම ඡන්ද බලය ඔවුන්ගෙන් අහිමි කරන ලදි. එසේ කරන ලද්දේ 1939 දී ඔවුන්ගෙන් කොටසක් රටින් පිට කර දැමීමෙන් සහ සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ ඊනියා 'බහුතරවාදී ප්‍රජාතන්ත්‍රවාදය' පිහිටුවා 1949 දී ලංකා පුරවැසිකම් පණත සම්මත කොට ගෙන ඉතිරි අයගේ පුරවැසිකම් නැති කර දැමීමෙනි. මෙසේ පුරවැසිකම් අහෝසි කර දමන්නට සිංහල සහ දෙමල ධනේශ්වර පක්ෂ හවුලේ ක්‍රියා කලහ. වාමාංශික සංවිධාන මෙයට මුළුමණින්ම විරුද්ධ විය.




වතු කම්කරු ජන කොටස් අතර පැතිර යමින් පැවතුන වමේ දේශපාලන බලය විනාශ කර දැමීම සඳහා මෙසේ පුරවැසිකම් අහෝසි කර දැමූ බව මගේ මතයයි. එහෙත් දෙමළ ජන කොටස් සලකන්නේ වතු කම්කරුවන් දෙමළ අය වීම නිසා රජය මෙසේ කළ බවයි. වමේ දේශපාලන බලය විනාශ කර දැමීම සඳහා සිංහල වාමාංශිකයින්ගේ ඡන්ද බලය අහෝසි කර දමන්නට රජය ඉදිරිපත් නොවීමෙන් මෙම කරුණ සනාථ වෙන බව ඔවුහු ඉදිරිපත් කර සිටිති.

ලංකාවට ෆෙඩරල් ක්‍රමයක් සුදුසු යයි 1926 දී පටන් නිර්දේශ කල බණ්ඩාරනායක මහතා 1956 දී දේශපාලන බලය ලබා ගැනීම සඳහා සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරුවන්ගෙන් සමන්විත සිංහල ජාතික බලවේගය උපයෝගී කර ගත්තේ ය. සිංහල සහ දෙමල භාෂා දෙකට සම තැන දිය යුතු බව 1956 ට පෙර සිටම නිර්දේශ කල බණ්ඩාරනායක මහතා 1956 දී දේශපාලන බලය ලබා ගැනීම සඳහා සිංහල භාෂාව පැය 24 න් රාජ්‍ය භාෂාව කරන්නට ප්‍රතිඥා දුන්නේය. සිංහල අන්ත ජාතික වාදීන්ගේ සහායද බණ්ඩාරනායක මහතාට ලැබිණි. යටත් විජිත වාදීන්ගේ පීඩනයට ලක් වී තිබුන සිංහල බලවේගය මෙයින් පුනර්ජීවනයක් ලැබුවේය. සිංහල සමාජයට සාපේක්ෂව බැළු විට මෙම පියවර ප්‍රගතිශීලී එකක් වූ අතර ඒ කාලයේ සිටි සිංහල අන්තවාදී සුළු කොටසක් අතර හැරුනු විට, පොදුවේ සිංහල සමාජය තුල දෙමළ විරෝධයක් තිබුනේ යයි මම කල්පනා නොකරමි.

බණ්ඩාරනායක මහතා 1956 බලය අල්ලා ගැනීමේ දී යටත් විජිත වාදීන් ගේ පීඩනයට ලක් වී තිබුන දෙමළ ජනතා බලවේගය මුළුමනින් අමතක කර දැමූ සැටි මීළඟ ලිපියෙන්.

ලයනල් බෝපගේ

## ලංකා ජර්මන් කාර්මික විද්‍යාලය සංවිධානය කරනු ලබන ශීල භාවනා වැඩසටහන

සදහම් සිසිලෙන් සිත් නිවමින්
අපිත් නහවමු ගතත් සීලෙන්
තුන් දොරට මඟ දෙසූ මුනිඳුන්
වදන් හඬගා කියමු සිහියෙන්

ලොව්තුරු බදු සම්දුගේ ටිපත බුද්ධත්වය හා පරිනිර්වානය සිදුවන වෙසක් මාසය ලොව වෙ සන බෞද්ධ බැතිමතුන් හට සුවිශේෂ මාසයකි. ආගමික වශයෙන් පුන්‍ය කටයුතු වල විශාල පිබිදීමක් සහ එවගේම සීලයෙහි පිහිටීම තුලින් මනුෂ්‍ය ජීවිතය ආලෝකමත් කර ගැනීමට ෙ බෞද්ධ බැතිමතුන් මෙම කාලය විශේෂයෙන් ප්‍රයෝජනයට ගනී.

මෙල්බරන් නගරය පුරාවට ඒ අසිරිය ඉතාමත් ඉහලින් සිදුවන බවද අපට ෙ නාරහසකි. මෙවර වෙසක් මාසයේ ඒ ටිතුම් පෙළී ගැස්ම වඩාත් ආලෝකමත් කිරීමට විශාල පිරිසකට ඉඩකඩ සැලසීම සඳහා ලංකා ජර්මාණු කාර්මික අභ්‍යාස විද්‍යාලීය ආදි ශිෂ්‍ය සංගමය තීරණය කර ඇත. සාක්‍ය කුලයෙන් නික්මී ටිතුම් බුද්ධත්වයට පත්වූ මුනිවරයානන් සිහි ගන්වන බෙරික්හී සාක්‍යමුනි සම්බුද්ධ විහාරයේදී රාජකීය පන්ඩිත අතිගරු විමලානන්ද ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සීල භාවනා ධර්ම සාකච්ජා වැඩ සටහනක් මැයි මස 10 දින ටදේ 08.00 සිට සවස 5.00 දක්වා පැවැත්වීමට තීරනය කර ඇත.

මෙම සිල් වැඩ සටහනට ධර්ම දේශනා සහ ධර්ම සාකච්ජා පැවැත්වීම සඳහා කීස්බරෝ ධර්ම සරන විහාරාධපති පූජ්‍යපාද නාඹටුන්නේ විජිත ස්වාමීන් වහන්සේද ටඩහේ ෙ න් සීලරතන ස්වාමීන් වහන්සේද ඩැන්ඩිනොන් ධර්මදීප භාවනා මධ්‍යස්ථානාධපති අකරවිට සංඝානන්ද ස්වාමීන් වහන්සේද සහභාගීවේ.

මෙම සීළී භාවනා වැඩසටහන ලංකා ජර්මාණු මාර්මික අභ්‍යාස විද්‍යාලීය ආදි ශිෂ්‍ය සංගමය සංවිධානය කරන අතර හිලන්පස සහ දානමය කටයුතු සඳහා ආගමික ෙ හ්දයකින් තොරව සියලුදෙනා සහභාගීවීම වශේෂ කරුනකි.

ධර්මයට සීළියට පිනට කුසලට සිත් ඇති සැමට මෙම ටිතුම් දවසේ අපත් සමග එකතු වන ලෙස සංගමය ගෞරවයෙන් ආරාධනා කර සිටී. වැඩි විස්තර දැනහැනීම සඳහා සරත් වික්‍රමසිංහ 9308 6114 අමතන්න.

president: slgttipresident@optusnet.com.au
secretary: secretaryslgtti@optusnet.com.au

Wickramapala Wanniarachch
secretary – SLGTTIOBA Australia Inc.
Mob: 0430 459 487

## පාරමිතා බෞද්ධ මධ්‍යස්ථානයේ පහන් කූඩු රාජයා



1992 පළමු වරට මෙල්බන් නුවර වෙසක් පහන් කූඩුවක් නිර්මාණය කළ ශිල්පීහු මෙවර අති දැවැන්ත වෙසක් පහන් කූඩු රාජයෙක් වෙසක් උත්සවය වෙනුවෙන් සෙන්ට් ඕල්බන්ස් පාරමිතා බෞද්ධ මධ්‍යස්ථාන භූමියෙහි නිර්මාණය කරති.

යන්ත්‍රානුසාරයෙන් ක්‍රියාත්මක වන දැවැන්ත ගුරුලෙකුගේ පිට මත නිර්මාණය වන මීටර් 4.5 ක් උස පළල මීටර් 8 ක් වන මේ පහන් කූඩුව පරිවාර කූඩු 120කින් පමන්විත වෙයි. ප්‍රධාන කූඩුව දෙඅතකට කැරකෙන ආකාරයට නිර්මාණය වනු ඇත.

මෙය පාරමිතා බෞද්ධ මධ්‍යස්ථානාධිපති දේවරක්ඛිත ස්වාමින් වහන්සේගේ හා නේවාසික ශික්ෂුන් වහන්සේලාගේ අනුශාසකත්වයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියේ අරමුණ විහාරස්ථානයේ අභිනවයෙන් ගොඩ නැගෙන බුදු මැදුරට ආධාර ලබා ගැනීමයි. මෙදින ආහාර පෙළෙක් ද පැවැත්වෙනු ඇත.